# විනය හා නීතිය

අද අප රටේ ඇති විනය පිරිහීම තේරුම් ගත හැක්කේ කෙසේද? මෙරට අනුකාරක ඇංකරයෝ මෙය තේරුම් ගැනීමටවත් උත්සාහ නොකරති. ඔවුන් යමක් තේරුම් ගැනීම යන්නෙන් අදහස් කරන්නේ සුද්දකු ඒ පිළිබඳ කියා ඇති දෙයක් තමන්ට සාපේක්ෂව තම තම නැණ පමණින් වටහා ගැනීමය. ඔවුන්ගේ ඥානය ගැන අපට වැටහීමක් ඇති බැවින් යමක් පිළිබඳ ඔවුන්ගේ සාපේක්ෂ දැනුම හෙවත් කසිකබල් පශ්චාත්ව්‍යුහවාදී අදහස්වලට අනුව ඔවුන්ගේ ඊනියා කියවීම ගැන අපට හොඳ තක්සේරුවක් ඇත. මොවුන්ට ප්‍රශ්නයක් ඇති වන්නේ එවැනි ප්‍රශ්නයක් තිබේ යැයි තුට්ටු දෙකේ සුද්දකු හෝ සුද්දියක හෝ ප්‍රකාශ කළහොත් පමණකි. සුද්දකුට හෝ සුද්දියකට හෝ නොපෙනෙන ප්‍රශ්න මේ ඇංකරයන්ට හා ඇංකරියන්ට නොපෙනෙයි.

ඇංකරයන් හා ඇංකරියන් දන්නා එකම දෙය සිංහල බෞද්ධ සංස්කෘතියට ගැරහීම පමණකි. මේ ගරහන්නන්ගෙන් විශාල පිරිසක් ගම්වලින් පැමිණි අය වෙති. ඔවුන් බොහෝ දෙනෙකුට ඉංගිරිසි ගැන එතරම් අවබෝධයක් නැත. ඔවුහු සිංහලයෙන් පමණක් ලියති. මෙරට ඉංගිරිසි කතාකරන සමාජය සමස්තයක් ලෙස ගතහොත් මොවුන් ගැන අසාවක් නැත. ඒ සමාජයේ ඔවුහු නොවැදගත් පිරිසක් වෙති. එහෙමත් මොවුන් කතා කරන්නේ බටහිර වත්මන් ඊනියා දියුණුව ගැනය. ඒ දියුණුව අප ද ලබා ගත යුතු යැයි ද බටහිරයන් මෙන් අප ද ඔවුන් කියන ආකාරයට නම් ශිෂ්ට විය යුතු යැයි ද ඔවුහු අපට කියති. ඔවුන් අතර සිටින අසීමිත හීන මානයකින් පෙළෙන එක්ස් කණ්ඩායම අප ඊනියා ශිෂ්ටයන් බවට පත්කිරීමට උත්සාහ කරති. මේ සියල්ලෝ ම අංක එකේ බටහිර සංස්කෘතික යටත්විජිතවාදීහු වෙති. බටහිර යටත්විජිතවාදී සුද්දන් එක් කලෙක තමන්ට ඇති බරක් ලෙස සැලකුවේ ආසියාවේ හා අප්‍රිකාවේ වැසියන් ශිෂ්ට කිරීමය. එය ඔවුහු වයිට්මැන්ස් බර්ඩන් ලෙස හැඳින්වූහ. අද එක්ස් කණ්ඩායමේ හීනමානයෙන් පෙළෙන්නෝ හා වෙනත් හීනමානයෙන් පෙලෙන ඇංකරයෝ හා ඇංකරියෝ ඒ බර තම කර පිටට ගැනීමට උත්සාහ කරති. සුද්දන්ගේ බර කරට ගන්නවුන් ගැන කිව යුත්තේ කුමක්ද?

සිංහල බෞද්ධ සංස්කෘතියට ගැරහීම නිසා ඇංකරයන්ට හා අංකරියන්ට සමාජ තත්ත්වක් ද ලැබෙයි. අද තරුණියකට නිදහසේ පාරෙ බැස යා හැකි දැයි අසන මොවුහු එසේ නොහැකි වීමෙන් පෙන්නුම් කරන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියේ පහත් තත්ත්වය යැයි ද කීමට අමතක නොකරති. මේ අනුකාරකයෝ වත්මන්කාමයෙන් පෙළෙති. වත්මන්කාමය යනුවෙන් මානසික තත්ත්වයක් සුද්දන් අර්ථකථනය කර නැත. ඔවුන්ට එසේ කිරීමට වුමනාවක්ද නැත. සුද්දන්ට

වත්මන්කාමයක් නැත. ඔවුන්ට ඇත්තේ අනාගතකාමයකි. ඔවුන් එය ද අර්ථකථනය කර නැත. තමන්ට ඇති රෝග ගැන සුද්දෝ කතා නොකරති. ස්ටාර් වෝර්ස් පමණක් නොව ජුරාසික් පාක් වැනි අනාගත බටහිර

විද්‍යාවක හා තාකෂණයක ඇතිවිය හැකි හපන්කම් ගැන කියන චිත්‍රපට නිපදවෙන්නේ මේ අනාගතකාමය නිසාය. අනාගතකාමයක් ඇති ඔවුහු තමන් විසින් නිර්මාණය කරන ලද වර්තමානයේ ජීවත් වෙති. සුද්දන්ගේ වර්තමානය යනු බටහිර යුරෝපයේ පහළොස්වැනි සියවසේ ඇරඹී අද ද බටහිර ක්‍රියාත්මක වන බටහිර නූතනත්වයේ ප්‍රතිඵලයකි. බටහිරයන්ට අවශ්‍ය වන්නේ ඔවුන්ගේ වර්තමානය ජීවන තත්ත්වයට වඩා සංස්කෘතික දේශපාලන හා ආර්ථික ව්‍යුහයන් අපට ද ලබාදීමය. මේ වර්තමානය කසිකබල් බටහිර සමාජයීය විද්‍යාත්මක දැනුම ලෙස ඒ ආකාරයෙන් ම අනුකරණය කිරීමේ අවශ්‍යතාවය ඇත්තේ මෙරට ඇංකරයන්ටය. මේ දීන ඇංකරයෝ සුද්දන්ගේ වර්තමානය ළඟා කර ගැනීම සඳහා තළු ගසමින් ඒ ගැන කාමයක් ඇති කරගෙන සුදු පංඩිතයන්ගේ මතිමතාන්තර තම තම නැණ පමණින් වටහා ගනිති. ඒ අනුව කලා කෘති සාහිත්‍ය කෘති නිර්මාණය කරති. ඒ සඳහා දීනයන්ට තෑගි බෝග ද ලැබේ. මේ වත්මන්කාමය සුද්දන් විසින් ඇති කරන ලද්දකි. එහෙත් සුද්දෝ එයට රෝගයක් යැයි නොකියති. ඒ වෙනුවට වත්මන්කාමයෙන් පෙළෙන්නන් සමාජයේ පොරවල් බවට පත්කිරීමට ඉතා සියුම් ව කටයුතු කරති.

එදා රන් අබරණින් සැරසී දකුණේ සිට උතුරට තරුණියකට තනිවම ගිය හැකිව තිබූ රටකට අද සිදුවී ඇත්තේ කුමක්ද? අද තිබෙන තත්ත්වය ඇති වීමට හේතුව කුමක්ද? සිංහල බෞද්ධ සංස්කෘතියද? කිසිසේත්ම නැත. අද

© Prof. Nalin De Silva

රටේ මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබෙන්නේම බටහිරයන් තමන් විසින් හා ඇංකරයන් මගින් සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල කරනු ලැබීමට කටයුතු කර ඇති බැවිනි. මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල නොකිරිණි නම් මෙවැනි තත්ත්වයක් උදා නොවනු ඇත. මේ තත්ත්වය උදා වී ඇත්තේම බටහිර සංස්කෘතික ආක්‍රමණය වීම නිසාය. මෙය අතීතකාමයක් නොව බටහිර සංස්කෘතික ආක්‍රමණයේ විනාශකාරීත්වය දැකීම හා ඉන් ගොඩ එන මග සාකච්ඡා කිරීමකි. අපට විමුක්තිය ලබා ගත හැක්කේ අපේ චින්තනය මත පදනම් වී අපේ දැනුම නිෂ්පාදනය කිරීමෙනි. ඉන් අදහස් කෙරෙන්නේ ආපසු අනුරාධපුරයට යෑමක් නොව අපේ චින්තනය පාදා ගෙන අවශ්‍ය නම් එයට තවත් යමක් එකතු කර බටහිර දැනුම ද ඒ තුළ අවශෝෂණය කර ගනිමින් නව දැනුම නිර්මාණය කිරීමය. සම්ම ජාතියේ දැනුම නිර්මාණය කර නැති ඇංකරයන්ට මේ කිසිවක් නොතේරෙයි. තේරුම් ගත්ත ද ඔවුහු ඒ බව පිළිගැනීමට අකමැති වෙති. එයට හේතුව ඒ පිළිගත් වහාම ඔවුනට ඇංකර සමාජය විසින් හිමි කෙරී ඇති පොරත්වය නැතිවීමය. ඇංකරයන් කුමක් කීවද මෙරට ස්ත්‍රිය කෙළි බඩුවක් ලෙස සැලකීමට පුදුරු කෙළේ බටහිර සංස්කෘතික ආක්‍රමණය විසිනි. අද මේ රටේ තත්ත්වයට වග කිවයුත්තෝ බටහිරයෝ හා අනුකාරකයෝය. ඔවුන්ට අවශ්‍ය තව තවත් සිංහල බෞද්ධ සංස්කෘතිය දුර්වල කිරීමය. මෙහිලා පේරාදෙණි සාහිත්‍යය, විශේෂයෙන්ම සාහිත්‍ය විචාරය හා පසුව වෙනත් කලාවන් විසින් කරන ලද විනාශයද සඳහන් කළ යුතුය. එය පසුව විස්තරාත්මක ව සාකච්ඡා කළ යුතු වෙයි.

මෙරට අද සිදුවන්නේ ජනතාවගේ චින්තනයට එරෙහි වු නීතියක් ක්‍රියාත්මක කිරීමය. කලින් ලිපියක සඳහන් කර ඇති පරිදි නීතිය හා විනය යනු දෙකකි. රටක නීතියත් විනයත් එකම චින්තනයක් මත පදනම් වු විට නීතිය මෙන්ම විනයද රැකීම පහසු වෙයි. විනයත් නීතියත් චින්තන දෙකක් මත පදනම් වු විටක විනය බලවත් වී නම් නීතිය කුමක් වුවද එය ජනසමාජයේ හදවතට කිඳා නොබසියි. විනය කඩා දැමු විටක නීතිය රැකීම අපහසු වෙයි. රටක විනය යන්න සංස්කෘතියේම ඓන්ද්‍රිය අංගයක් වෙයි. මෑතක් වන තුරුම මෙරට විනය රැඳී පැවතුණේ සිංහල බෞද්ධ සංස්කෘතිය මත. පදනම් වෙමිනි. ගමයි පන්සලයි යනුවෙන් අදත් හැඳින්වෙන්නේ මේ විනය ක්‍රියාත්මක වූ සමාජ ව්‍යුහයේ එක් වැදගත් කොටසකි. රටේ නීතිය රෝම ලන්දේසි නීතිය වුවද එය ගම්වල එතරම් කිඳා නොබැස්සේය. ඉතා මෑතක් වන තුරුම සිංහලයන් හික්මවනු ලැබුයේ රෝම ලන්දේසි නීතිය මගින් නොව සිංහල බෞද්ධ විනය මගිනි. මේ විනය කඩා දැමීමට බ්‍රිතානීන් සෑම උත්සාහයක්ම දැරූ නමුත් ඒ අසාර්ථක විය. බ්‍රිතානීන් හාමුදුරුවරුන් හැඳින්වූයේ සිංහල බෞද්ධයන්ගේ කහකඩ හමුදාව ලෙසය. හාමුදුරුවන්ගේ බලය නැති කිරීම සඳහා සුද්දෝ නොයෙකුත් දෑ කළහ. අප කළ යුත්තේ සමාජය තුළ භික්ෂූන් වහන්සේ දරූ තත්ත්වය නැවත ඇති කිරීමය.

සුද්දනට නොකළ හැකි වු දෙය කළු සුද්දෝ කළහ. ඔවුහු බටහිර අධ්‍යාපනය ගමටද ගෙන ගියහ. එමගින් අවසානයේ දී සිදු වුයේ ගම්බද පාසල්වල දරුවන්ට ගමේ පන්සල විසින් පිහිටුවන ලද විනය අහිමි කිරීමය. පාසලින් ළමුන්ට උගන්වනු ලැබුයේ බ්‍රිතානි විනයකි. ළමුන්ගේ සිංහල බෞද්ධ විනය කඩා දැමුණ ද පාසල් හරහා බ්‍රිතානි විනය පාසල්වලට ගෙන ගියද එය සිසුන්ගේ සිත්තුළට ගෙන යෑමට නොහැකි විය. බ්‍රිතානි නීතිය මෙන්ම විනයද අපට ආගන්තුක විය. අපේ නොවන විනයක් අපට කාවැද්දිය නොහැකිය. බ්‍රිතානි විනය ඇත්තේ අපේ චින්තනයට පිටින්ය. පාසල් සිසුන්ට එය විභාගය සඳහා පාඩම් කර ගත යුතු දේ මිස ඇඟට වැදුණු දෙයක් නොවේ.

අද මෙරට විනයක් නැත්තේ එක් පැත්තකින් අපට තිබු විනය සහ ඒ සමඟ සම්බන්ධ වු සමාජ ව්‍යුහයන් කඩා බිඳ දමා ඇති බැවිනි. අනෙක් පැත්තෙන් කඩා බිඳ දැමුණු සිංහල බෞද්ධ විනය වෙනුවට බටහිර විනයක් හෝ ආදේශ කිරීමට නොහැකිව ඇති බැවිනි. බටහිර විනය ආදේශ කිරීමට නොහැක්කේ එය අපේ චින්තනය මත පදනම් නොවන බැවිනි. බටහිර වෛද්‍ය විද්‍යාවෙහි මිනිස් සිරුරේ ඇතැම් කොටස් වෙනුවට වෙනත් අයගෙන් ලබා ගත් කොටස් බද්ධ කිරීමට යෑමේ දී ඇතැම් විට ඒ ආගන්තුක කොටස් ශරීරය විසින් ප්‍රතික්ෂේප කෙරෙන බව බොහෝ දෙනා දනිති. සමාජය යනු සිරුරක් ලෙස ගැනීම වැරැදිය. එහි එක්තරා ආකාරයකින් ගත් කල මනසක්ද වෙයි. සමාජයට පිටින් යමක් ලබා ගැනීම ඇංකරයන්ට පිටින් ලැබෙන දෑ අනුකරණය කිරීම තරම් පහසු නොවේ. බොහෝ විට සමාජය එය ප්‍රතික්ෂේප කරයි. බටහිර විනය සම්බන්ධයෙන් ද මෙරට සමාජයෙහි සිදු වන්නේ එවැන්නකි.

බටහිර විනය සමාජය විසින් සමස්තයක් ලෙස ගත් කළ ප්‍රතික්ෂේප කෙරෙන විට බටහිර නීතියට එනම් ලංකාවේ නම් රෝම ලන්දේසි නීතියට කල හැකි දෙයක් නැත. නීතිය යනු සමාජයකට උඩින් ආරෝපණය කෙරෙන ව්‍යුහයක්

පමණකි. එය මිනිසුන්ගේ මනසට කිදා නොබසියි. නීති මගින් පමණක් සමාජයක් සුවපත් කළ හැකි නොවේ. අපේ නොවන දෙයක් ඇතැම් විට අප මත බලහත්කාරයෙන් පැටවිය නොහැකි අයුරින් බටහිර විනයද සමාජය තුළ කිදා බැස්සවීමට නොහැකිකම හේතුවෙන් අද අපට විනයක් නැත. අපි ඒ වෙනුවට බටහිර බොහෝ දෑ උඩින් පල්ලෙන් අතගා ඒ අනුකරණය කරන්නමු. මොනිං බායි වැනි ප්‍රකාශවල පමණක් නොව ස්ත්‍රීන්ට සලකන ආකාරය තුළ ද මේ අනුකරණය දැකිය හැකිය. එපමණක් නොව ඇංකරයන්ගේ කෙරුවාව තුළ ඒ දැකිය හැකිය. මේ බටහිර විනයේ හරය නොමැතිව පිටපොත්ත අනුකරණය කිරීම නිසා සිදුවන්නකි. බටහිර විනයේ පමණක් නොව බටහිර සෑම දෙයක්ම අප අනුරණය කරන්නේ පිටපොත්ත පමණකි. මේ පිටපොත්ත අනුකරණය කළ ද අප තවමත් සිතෙන් ජීවත්වන්නේ ගමෙහි ය. හීණමානයෙන් පෙළෙන්නන්ට නොතේරුණ ද සිංහල ගීත රචකයන් ආදීන් තවමත් ඉපනැල්ලේ සුවඳ ගැන සඳහන් කරන්නේ එබැවිනි.

අපි ලෝක දෙකක එක්වර ජීවත්වීමට උත්සාහ කරන්නෙමු. එකක් අපේ චින්තනය මත පදනම් වූ ගැමි ලෝකය ය. බටහිර නූතනත්වයට සවිඥානික ව හෝ අවිඥානිකව යට නොවෙන මිනිස්සු වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ගැමියෝ වෙති. මේ ලෝකය සමග අප උඩින් පල්ලෙන් අතගා අනුකරණය කරන බටහිර නූතනත්වයේ ලෝකය වෙයි. අති නවීන මෝටර් රථයක යෑමට ආශාකරන අතර වැවේ නෑමටද බොහෝ දෙනාට අවශ්‍ය වෙයි. එහෙත් මේ ලෝක දෙකෙහි එක් ලෝකයකවත් විනය අපට නැත. අපේ විනය සුද්දන් හා කළු සුද්දන් බිඳ තමා ඇති අතර බටහිර විනය සමාජය තුළට කා වැද්දීමට නොහැකි වී ඇත.

අවසාන වශයෙන් කිව යුත්තේ අනුකාරකයන්ට ද බටහිර දැනුම අනුකරණය කළ හැක්කේ උඩින් පල්ලෙන් පමණක් බවය. මේ එකකුටවත් සම්ම ජාතියේ බටහිර දැනුමට නිර්මාණාත්මකව යමක් එකතු කළ හැකි නොවේ. ඒ සඳහා වූ බටහිර චින්තනයේ ප්‍රධාන ම අංගයක් වූ වියුක්ත බව මොවුන්ට ගැටීවත් නැත. තමන්ට කළ හැක්කේ සුද්දන්ගේ දැනුම උඩින් පල්ලෙන් තේරුම් ගැනීම පමණක් බව වත් ඇංකරයෝ නොදනිති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva